LANKADISSENT

# රජයේ ඉහළ නිලධාරීන් 300 කට දූෂණ චෝදනා

[2008-12-17 11.55 am] වත්කම් හා දූෂණ චෝදනා එල්ල වී ඇති ඉහළ පෙළේ රජයේ පරිපාලන, පොලීසියේ සහ ආරක්ෂක අංශ ප්‍රධානීන් රැසකට අයත් විමර්ශන ලිපිගොනු 300 ක් පමණ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ ගොඩ ගැසී ඇතැයි 'දූෂණ විමසුම' සංවිධානයේ ප්‍රකාශක නීතිඥ ශිරාල් ලක්තිලක මහතා 'ලංකා ඩිසෙන්ට්' වෙත පැවැසීය.

මේ හැරුණු කොට ආණ්ඩුවේ ප්‍රබල දේශපාලනඥයින් 30 කට වැඩි පිරිසකට එරෙහිව ද කොමිසම විසින් විමර්ශන ආරම්භ කර ඇති අතර, රුපියල් කෝටි ගණනින් අයථා ලෙස

වත්කම් ඉපයීම හා රාජ්‍ය දේපළ අයුතු ලෙස පරිහරණය කිරීම මොවුන් වෙත එල්ල වී ඇති චෝදනා වේ. ආණ්ඩුවේ ප්‍රබල අමාත්‍යවරුන් හතර දෙනෙකු ගේත්, මහ ඇමැතිවරුන් දෙදෙනෙකු ගේත්, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු ගේත් විමර්ශන ලිපිගොනු මෙසේ විමර්ශනය වෙමින් පවතී.

වත්කම් දූෂණ හා අල්ලස් චෝදනා සම්බන්ධයෙන් දැනට දහසකට වැඩි ලිපිගොනු සංඛ්‍යාවක් කොමිසමේ ගොඩ ගැසී ඇති බව සඳහන් කරන ලක්තිලක මහතා, මහා පරිමාණ වත්කම් හා දූෂණ චෝදනා සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියා මාර්ග සඳහා යොමු කළ යුතු මට්ටමේ ලිපිගොනු ගණනාවක් මේ වන විට විවිධ බලපෑම් හේතුවෙන් වසා දැමීමේ සැලැස්මක් ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරයි.